ශ්‍රීලාල් සෙනෙවිරත්න.

මෙවර (2012) 'ස්වර්ණ පුස්ථක' සාහිත්‍යය සම්මානයෙන් පිදුම් ලැබුවේ ලේඛිකා රූපා ශ්‍රියානි ඒකනායකගේ 'සිටුවර පුවත' නවකතාවයි. පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරිනියක වූ රූපා ශ්‍රියානි සාහිත්‍ය ක්ෂේත්‍රයට පිවිස ගතව ඇත්තේ කෙටි කාලයකි. මේ වන විට ඇය විසින් රචනා කරන ලද නවකතා සංඛ්‍යාව පහකි.

රූපා ශ්‍රියානි ගත්කතුවරියක ලෙස දොරට වඩින්නේ 1999 වසරේ 'සව්සිරි සපිරි සවුදිය' නමින් වාර්තාමය පොතක් රචනා කර

ඉතිං එක විනිශ්චය මණ්ඩලයක මිනුම් දඬුවලට අනුව හොඳ පොතක් තව විනිශ්චය මණ්ඩලයක මිනුම් දඬුවලට අනුව නරක වෙන්න පුළුවන්. එක සම්මාන උත්සවයක සම්මාන ලබපු කෘතියම අනෙක් ඒවායෙත් සම්මාන ලැබිය යුතුයි කියලා අපිට කියන්න බෑනේ. මීට පෙරත් එක සම්මාන උළෙලක සම්මාන හිමිවෙන පොත තව සම්මාන උළෙලකදී ප්‍රතික්ශේප වෙලා තියනවා. අනික අපි නවකතා ලියන්නේ සම්මාන බලාගෙන නෙවෙයි. අපි ලියනවා. ප්‍රකාශකයෝ සම්මාන උළෙලවලට දානවා. ඒ නිසා මට නම් ගැටළුවක් නෑ.

**සිටුවර පුවත සමකාලීන සමාජ අත්දැකීමක් පාදක කරගත් නවකතාවක්. එය සත්‍ය**

## පොත් පත් පුවත්

### සිටුවර පුවත

*රූපා ශ්‍රියාණි ඒකනායක*

*සූරිය ප්‍රකාශන/ මිල රු:430/-*

ටෝල්ස්ටෝයිගේ ඇනා කරලිනා නවකතාවේ චරිත ගැන එල්ල වුණ විවේචනවලට පිළිතුර විදිහට ඔහු කිව්වේ 'මගේ නවකතාවල චරිත හැසිරෙන්නේ මට ඕනේ හැටියට නෙවෙයි' කියලයි. ඇත්තටම ඒක කතාව ලියාගෙන යනකොට ඒ අනුව සිදුවෙන දෙයක්.

**ඔබේ අනාගත බලාපොරොත්තු මොනවාද?**

ජනවාරි මාසේ මම රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබුවා. දැන් මට ලොකු විවේකයක් තියනවා. ඒ නිසා ඉදිරියේදී මම බලාපොරොත්තුවෙනවා

# සිටුවර පුවත ලියන්න මට අවුරුදු පහක් ගියා

## රූපා ශ්‍රියාණි ඒකනායක




ප්‍රකාශයට පත්කිරීමෙනි. අනතුරුව 2000 වසරේදී ළමා කතා පොත් පහක් රචනා කළ ඇය 2002 වසරේදි 'දේශානුරාගය' නමින් කෙටිකතා සංග්‍රහයක්ද රචනා කළාය. රූපාගේ ප්‍රථම නවකතාව 'විජයයි කුවේණියයි'(2003) සහ දෙවන නවකතාව 'සෙංකඩගල මහබිසෝ'(2005) ඓතිහාසික පුරාවෘත මුල්කොට රචිත නවකතාය. සමකාලීන සමාජ  අත්දැකීමක් පසුබිම් කරගනිමින් 2006 වසරේදී ඇය රචනා කළ තෙවන නවකතාව, 'තරු බඹසර' එවර ස්වර්ණ පුස්ථක සම්මානය සඳහා නිර්දේශ විය. 2009 වසරේදී ප්‍රකාශයට පත්කෙරුණු ඇයගේ සිව්වන නවකතාව 'දුටිම් නෙතින් කසුප් නිරින්ද්' ගෙඩගේ සාහිත්‍ය සම්මාන උළෙලේ එවර හොඳම නවකතාව ලෙස සම සම්මානයෙන් පිදුම් ලැබුවේය.

'සිටුවර පුවත' ඇය රචනා කර ඇත්තේ සමකාලීන සමාජය මුහුණ දෙන අත්දැකීමක් තේමාකරගනිමිනි. විවාහාපේක්ෂිතව සිටියදී ආබාධිත වන තරුණයකු සහ ඔහුගේ අතගැනීමට නොඉවසිලිමත්ව සිටි තරුණියක මුහුණ දෙන අනපේක්ෂිත අත්දැකීම් සමුදායක් රූපා සිටුවර පුවතින් සාකච්ඡාවට ලක්කරන්නීය. වත්මන් සමාජයේ පෘතග්ජන මිනිසුන් එක් අතෙකින් තමන්ම රවටාගෙන ගෙනයන, ව්‍යාජ මුත් ප්‍රායෝගික ජීවිතයෙන් බිඳක් මේ නවකතාව තුළින් පාඨක සිත් තුළ සිතුවම් කරන්නට ඇය උත්සාහ ගෙන තිබේ.

**මේ වසරේ හොඳම නවකතාව ලෙස සම්මාන දීමට සුදුසු එකම නවකතාවක්වත් නොමැති බව ගොඩගේ සාහිත්‍ය සම්මාන විනිශ්චය මණ්ඩලයේ තීරණය වුණා. ඒ ගැන ඔබගේ අදහස?**

විනිශ්චය මණ්ඩලවල ඉන්නේ සාහිත්‍ය ගැන ප්‍රාමාණික දැනුමක් තියන, සාහිත්‍ය විෂයය උගන්වන, සාහිත්‍ය කටයුතුවල නියැළිලා ඉන්න විද්වතුන් පිරිසක්. ඒ නිසා ඒ අයගේ තීරණය අපි පිළිගන්න ඕනේ. එයට ගරුක-රන්න ඕනේ. පාර්ශ්වකරුවෙක් විදිහට මට නම් ඒ තීරණය විවේචනය කරන්නට කොහෙත්ම පුළුවන්කමක් නෑ. එයට අභියෝග කිරීම සදාචාරාත්මක නෑ.
ගොඩගේ සාහිත්‍ය සම්මාන විනිශ්චය මණ්ඩලයෙන් ප්‍රතික්ශේප වුණ ඔබගේ 'සිටුවර පුවත' ට පොත් ප්‍රකාශකයන්ගේ 'ස්වර්ණ පුස්ථක' සම්මානය හිමිවෙනවා. ඔබට මෙය ගැටළුවක් නොවෙයිද?

සාහිත්‍ය සම්මාන උත්සව කීපයක්ම පැවැත්වෙනවනේ. ඒවායේ විනිශ්චය මණ්ඩල විවිධයි. මිනුම් දඬු විවිධයි. ඇත්තටම ඒ මිනුම් දඬු මොනවද කියලා අපි දන්නෙත් නෑ.

**අත්දැකීම් ඇසුරින් ලියැවුණ එකක්ද?**

නැහැ. නමුත් මෙහි හමුවෙන චරිත මුහුණ දෙන අත්දැකීම වර්ථමානයේ අපේ සමාජයට පොදු අත්දැකීමක්.

**ඔබට නවකතාවක් ලියන්න කොයිතරම් කාලයක් ගතවෙනවද?**

ඒක එකින් එකට වෙනස්. සිටුවර පුවත ලියන්නම් අවුරුදු පහක් විතර ගතවුණා. නවකතාවක් ලියන්න වස්තු බීජයක් හිතට ආවම ලියන්න පටන්ගන්නවා. ඒ අතරේ තවත් කතාවකට වස්තු බීජයක් ආවොත් ඒකත් ලියන්න පටන්ගන්නවා. සමහර වෙලාවට කතා කීපයක් ඒ විදිහට ලියනවා. ඒ නිසා ගතවෙන කාලය මෙච්චරයි කියලා කියන්න බෑ. අපිට තියන විවේකය අනුවත් ඒක වෙනස් වෙනවා.

**චරිත ගොඩනගන්නේ කොහොමද?**

යම් වස්තු බීජයක් හිතේ ඇතිවුණ තැන ඉඳලා ඒක නවකතාවකට පෙරළනකොට එහි චරිත හැසිරෙන ආකාරය ගැන පූර්ව විනිශ්චයක් හුඟක් වෙලාවට නෑ. ලියාගෙන යනකොට තමයි ඒක තීරණය වෙන්නේ. ලියෝ

**ඔබ මුලින්ම සාහිත්‍ය නිර්මාණකරණයට යොමුවෙන්නේ මොන විදිහටද?**

මගේ මහත්තයාට සෞදි අරාබියේ තානාපති කාර්යාලයේ රැකියාවට යන්න සිද්ධ වුණා. ඒ නිසා මටත් දරුවන් දෙන්නටත් ඒ රටේ නවතින්න සිදුවුණා. කාන්තාවක් හැටියට මට තානාපති කාර්යාලයෙන් ලැබිලා තිබුණ උපදෙසක් තමයි කිසිම අවස්ථාවක තනියම නිවෙසින් පිටතට යන්න එපා කියන එක. ඒ නිසා ගෙදරට කොටුවෙලා නිකරුණේ කාලය ගතකරමින් ඉන්නකොට තමයි ලියන්න හිතුණේ.

සාහිත්‍ය නිර්මාණයකරණය වෙනුවෙන් වැඩි වේලාවක් වෙන් කරන්න. මගේ වැඩි කැමැත්තක් තියනවා ළමා කතා ලියන්න. නවකතාත් ලියැවෙයි.

*(මේ සාකච්ඡාවේ හඬපටයට තිසර ගුවන් විදුලියේ "සාහිත්‍ය කතිකාව" වැඩසටහනින් සවන් දිය හැකිය සාහිත්‍ය කතිකාව ඉදිරිපත් කරනු ලබන්නේ ශ්‍රීලාල් සෙනෙවිරත්න විසිනි* www.sannasa.net *ඔස්සේ හෝ ඔබේ ස්මාට්ෆෝන් එක ඔස්සේ හෝ තිසර අසන්න)*

